**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120
ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635
දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk

මගේ අංකය / எனது இலக்கம் / My NO — 181 /
ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024
දිනය / திகதி / Date — 31/01/2024 පැය 0925

## මාධ්‍ය නිවේදනය

### විෂ මත්ද්‍රව්‍ය වැටලීම් සඳහා දිවයින පුරා ක්‍රියාත්මක විශේෂ මෙහෙයුම - පොලිස් මූලස්ථානය.

විෂ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් හා බෙදා හරින්නන්ගේ ජාලයන් මර්ධනය කර ඔවුන් අත්අඩංගුවට ගැනීම සඳහා මුළු දිවයිනම ආවරණය වන පරිදි 2023.12.17 වන දින සිට විශේෂ මෙහෙයුම් ආරම්භ කර ඇත.

එයට සමගාමීව 2024.01.30 වන දිනය තුල සිදු කරන ලද මුළු වැටලීම් 502 කට අදාලව සැකකරුවන් 489 ක් හා සැකකාරියන් 10 ක් අත්අඩංගුවට ගෙන ඇත. ඉන් සැකකරුවන් 03 ක් වැඩිදුර විමර්ශන සඳහා රඳවා තබා ගැනීමේ නියෝග ලබා ගැනීමට අපේක්ෂිතව ඇති අතර සැකකරුවන් 04 දෙනෙකු පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි.

**මෙම මෙහෙයුමේදී බස්නාහිර පළාත ආවරණය වන පරිදි සිදුකරන ලද මත්ද්‍රව්‍ය වැටලීම් වලදී හෙරොයින් ග්‍රෑම් 89 ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 102 ක්, ගංජා ග්‍රෑම් 400 ක් පොලිසිය භාරයට ගෙන ඇති අතර එම පළාත තුල සිදු කල මුළු වැටලීම් 267 කදී සැකකරුවන් 261 ක් හා සැකකාරියන් 06 ක් අත්අඩංගුවට ගෙන ඇත.**

**දකුණු පළාත ආවරණය වන පරිදි සිදු කරන ලද මත්ද්‍රව්‍ය වැටලීම් වලදී හෙරොයින් ග්‍රෑම් 11 ක් හා ගංජා ග්‍රෑම් 269 ක් පොලිසිය භාරයට ගෙන ඇති අතර එම පළාත තුල සිදු කල මුළු වැටලීම් 54 කදී සැකකරුවන් 53 ක් හා එක් සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.**

වැටලීමට අදාල විශේෂිත සංඛ්‍යා තොරතුරු පහත සඳහන් කර ඇත.

2024.01.30 වන දින දිවයින තුල සිදු කරන ලද වැටලීම් සම්බන්ධ වාර්තාව.

| | | |
|---|---|---|
| හෙරොයින් | ප්‍රමාණය (g / mg) | 146.688 |
| අයිස් මත්ද්‍රව්‍ය | ප්‍රමාණය (g / mg) | 119.204 |
| ගංජා | ප්‍රමාණය (g /mg) | 945.595 |
| | ගංජා පැල | 6241 |
| වෙනත් මත්ද්‍රව්‍ය | ප්‍රමාණය (g / mg) | 1181.98 |
| මත්පෙති | | 30 |
| මුළු වැටලීම් ගණන | | 502 |
| අත්අඩංගුවට ගත් මුළු සැකකරුවන් ගණන | ස්ත්‍රී | 10 |
| | පුරුෂ | 489 |
| රඳවා තබා ගැනීමේ නියෝග ලබා ගැනීමට අපේක්ෂිත සැකකරුවන් ගණන | | 03 |
| පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමට අපේක්ෂිත පුද්ගලයින් ගණන | | 04 |

2024.01.30 වන දින අත්අඩංගුවට ගත් වරෙන්තුකරුවන් සම්බන්ධ වාර්තාව.

| | |
|---|---|
| විෂ මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් විවෘත වරෙන්තුකරුවන් ගණන | 19 |
| විෂ මත්ද්‍රව්‍ය නොවන වැරදි සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් විවෘත වරෙන්තුකරුවන් ගණන | 204 |
| ඇඟිලි සටහන් ඔස්සේ අනාවරණය වී ඇති අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | 01 |
| බල අපරාධ සම්බන්ධයෙන් හඳුනා ගෙන ඇති අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | 06 |

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**